# එක් වෙසක් සමයක්හි...




වෙසක් සමය එළැඹෙත්ම මෙල්බර්න් නුවර ද බුදුරජාණන් වහන්සේගේ ත්‍රෛයිමංගල්‍යය සැමරීමට ලහි ලහියේ සූදානම් වන්නී ය. සෑම වසරක ම පාහේ වෙසක් පහන් කූඩු, තොරණ නේක සැරසිලිවලින් අනූන වූ ආමිස පූජාවන්ගෙන් ද බණ භාවනාවන් ගෙන් සිත් සනහාලන ප්‍රතිපත්ති පූජාවන්ගෙන් ද කිසිඳු අඩුවක් නැත්තේය මෙල්බර්න් පුරවරය...... පන්හිඳ සුපුරුදු "වෙසක් ලියවිල්ල" සුපුරුදු විදියටම ලියන්න මුල පිරුවා.

"මේ "මවුස්" එක වැඩ කරන්නෙම නෑනේ" පින්සල "කොම්පියුටරයේ" මොනිටර් එක දිහා බලාගෙනම වේගයෙන් "මවුස්" එක එහා මෙහා කරන ගමන් කිව්වා. ඒත් "කර්සර්" එක එකම තැන !

"කෝ බලන්න.. ඔය "මවුස්" එක ළඟදිනෙ ගත්තෙ" පන් ලියන මේසයෙන් නැගිටලා ආවා පින්ගෙ "කොම්පියුටරය" ගාවට.

"සන්තානං මෑණියනේ....!" පන්ට වෙසක් අමතක වෙලා නත්තල් සිහිවුණා.

"තමුන්නැහෙ ඔය "මවුස්" එක කියලා අල්ලාගෙන හොල්ලන්නේ " කැල්කියුලේටරයක්නෙ" ඇත්ත නේන්නං. "මවුස්" එක පැත්තක. එතකොටයි පින් "මොනිටරයෙන්" තමුනගේ ඇස් දෙක අහකට අරගෙන ඒ දිහා බැලුවේ. ඔය කිව්වට පන්ටත් දවසක ඔය වාගෙ ම වැඩක් වුණා. "කොම්පියුටර්" තිරයෙ තියෙන "එක්ස් - එල්" ලයිස්තුවට ගණන් ඉලක්කං වගයක් ඇතුලත් කරන්න පන් එබුවෙ ළඟ තබුණ "කැල්කියුලේටරයේ" බොත්තං! මිනිස්සු යන්ත්‍ර සූත්‍ර, අළුත් දෙවල් හොයාගෙන ඒවා තමුන්ගෙ පහසුවට මෙවලම් විදියට පාවිච්චි කළත්, ඒ දේවල් පාවිච්චි කරන්නෙ ආයෙමත් තමුන්ම නේද කියලා හිතනවා මදි. හිත එකඟ කරගෙන, අවධානය තමුන්ට අවශ්‍ය දේට හරියාකාරව යොමු කරලා, මොකක්ද තමුන්ට කරන්න ඕනෙ කියලා වටහගෙන කරන්නෙ නැත්නම් මොන

**වෙසක් සමයට පමණක් ම සීමා නොවී කෙරෙනා පින්කම් ද බොහෝ ය. කිනම් වූ පරමාර්ථ යන්ගෙන් කෙරෙන්නේ දැයි විමසීමට පෙර කාර්යයන්ගෙ සමාජයකට වන සෙත පිළිබඳවත්, ඒ වෙනුවෙන් කෙරෙන කැපවීම පිළිබඳවත් විමසනු වටීයි. අයහපත් පරමාර්ථයන්ගෙන් කෙරෙන කාර්යයන්ගේ පළ ඒ ඒ අයටම නොවේ ද? සුනන්දා තිලකරත්න ආචාර්යවරිය මූලිකව ප්‍රකාශයට පත්කෙරෙන "හිරු කිරණ" බෞද්ධ පුවත් පතත්, ගාමිණි ෆොන්සේකා මාධ්‍යවේදියා මූලිකව ගුවන් ගතවන "සඳහම් හඬ" ගුවන්විදුලි වැඩසටහනත් මෙහිලා නිදසුන් සේ දක්වනු වටීයි.**

තරම් විද්‍යාවෙන් තාක්ෂණයෙන් දියුණු වුණාත් වැඩක් තියෙයි ද?

"ටක ටොකොස් ටකස්..." කියලා පින් තමුන් කර කර හිටපු වැඩේ "සේව්" කරලා එළියට ගියේ වචනයක්වත් කතා නොකර. ලැජ්ජාවට වෙන්ඩැ !

වෙසක් සඳ සමගින් ම මෙල්බර්න් නුවර පායන කලා කරුවන් රැසකි. කාලයක් තිස්සේ තොරණක සිතුවම් අතරින් පෑයු වෙලින්ටන් මොල්ලිගොඩ කලා කරුවා සිහිවේ. මොල්ලිගොඩ ශිල්පි තෙලි තුඩින් හැඩවෙන්නේ තොරණ පමණක් ම නොවේ. "සමාධි බැති ගී කවය" වෙසක් භක්ති ගීත ගායනාවලට පුහුණු කරවමින් සහ මෙහෙයවමින් තබ්ලා කුට්ටම අතරින් පායන්නේ කොලින් පල්ලියගුරු ශිල්පියායි. "සමාධි" පසුගිය දහ අටවන දා පෙඩරේෂන් චතුරස්‍රයේ පැවැත්වුණ "මෙල්බර්න් බහුසංස්කෘතික බෞද්ධ උත්සවයේ" දී ද බැති ගී ගායනාවන් ඉදිරිපත් කළාය. සංවිධායකයින් විසින් පිරිනමන්නට යෙදුණ වූ තිළිණය පිළිගනිමින් හේමාල් ජයරත්න මහත්මා සංවිධායකයින්ටත් කණ්ඩායම දිරිගන්වමින් එහි පැමිණ සිටි සැවොටමත් ස්තූති කළේ ය. ඉදිරි වසරවල දී ද මෙලෙසින් සහභාගි වීමට "සමාධි" ආරාධනා ලැබුවාය.

"වෙසක් කාලෙටයි - කාගෙත් පිනකම්
කාට පෙනෙන්න ද - අනෙ මන්දා
නම්බු රැකීමයි - නිවන් දැකීමයි
එක මඟ යන්නේ - කොහොම ද මන්දා"

පින් ඉරිදා උදේ රේඩියෝ වැඩ සටහන දාලා. "විමසුම" අගය ඉවරවුණේ ඔය සින්දුවෙන්. කවුරු ලිව්වත් කවුරු ගැයුවත් පංකාදු සින්දුව. හැබැයි ඕකට එකතු කරන්න ඕන කියෙල හිතෙන තවත් අදහසක් ලියලා තියන්න පන්ට හිතුණා.

ප්‍රතිපත්තිමය පූජාවන්ට අමතරව කෙරෙනා ආමිස පූජාවන් ද අත්‍යාවශ්‍ය අංගයකි. හුදෙක් භක්තිය නිසාවෙන් ම කරන්නට යෙදුනා වූ වෙසක් සැරසිලි, දන්සැල් වැනි දෑ බොදු ළමා සිත් බෞද්ධානන්දයෙන් පුරවා බොදු පරිසරයට ඉදිරි පරපුර පෙර හුරු කරනවා නො වේද? දහමට නැඹුරුව ප්‍රතිපත්තිමය දේ වෙනුවෙන් සිත් යොමු කරවන්නේ ඒ ආනන්දයෙන් පිරි පරිසරයමයි. බෞද්ධාගම ලොව ප්‍රචලිත කරවමින් එහි සිහිල දසත පතුරවන්නට මහත් රුකුලකි ආමිස පූජාවන්.

වෙසක් සමයෙහි කළ නොයෙක් සද්කාර්යයන් හුදෙක්



සද්භාවයෙන්ම සපිරුනේ වී නමුදු දුප්පත් අහිංසක ගැමියනට කළ හැකි දේට වඩා වැඩි යමක් කිරීමේ දී ඊට සවිය ඇතියවුන් මූලික වීම නිරායාසයෙන් ම සිදු විණ. වර්තමානයේ එය වාණිජකරණය වී ඇති බැව් සැබවි. පෞද්ගලික කීර්තිය නංවා ගන්නා අංගයක් බවට පත් වී අති බව ද සැබවි. නමුදු සමස්ථයම එලෙසින් හුවා දැක්වීම කෙතරම් දුරට සාධාරණ ද? වාසනාවකට මෙන් සද්භාවයෙන් ම කෙරෙනා දෑ මව්බිමෙහි නම් රැඳී ඇත්තේ ය. පොසොන් දිනයක මව් බිමට ළඟා වූ අප හට ගුවන් තොටේ සිට අවිස්සාවේල්ල දක්වා පෞද්ගලික වාහනයක යාමට පැය පහක් පමණ ගත විය. හන්දියක් පාසා පැවැත් වුණ දන්සල් හා පුණ්‍යස්ථාන අවට වූ වාහන තද බදය නිසාවෙනි ඒ. ගමේ තරුණයින් එක්ව විනෝදයට මෙන් කරන්නා වූ දන්සැල් වන්දනාමාන සඳහා යන්නවුන්ගේ මෙන් ම වෙසක් නැරඹීමට යන්නවුන් සනහාලන්නේ ය. මේ සියල්ල "නම්බුව" සඳහා ම ද? වාර්ෂිකව හංවැල්ල, පහත්ගම, තුන්නානේ ඉදිවන දැවැන්ත තොරණ රාජයාගේ නිර්මාණකරු සිය නම හෙළි නොකරන්නේ. බරපැන ගම්මුන්ගෙනි.

වාණිජකරණයට හා පෞද්ගලික ඕනෑ එපාකම්වලට බිළිවන්නේ "වෙසක්" පමණක් ම ද? රුපියල් ඩොලර්වලින් ගණන් හදන ගණක යන්ත්‍ර සෙල වූ පමණින් ම කිසිම ක්ෂේත්‍රයක සරු යමක්, නැවුම් යමක් නොකෙරේ. ඒ - ඒ ක්ෂේත්‍රයන් පරිගණකයක් සේ සිතුව හොත් එහි "කර්සර්" නම් වූ ඊතලය සොලවා නව ඉසව් වෙත යා හැකි වන්නේත්, නව මං විවෘත කර ගත හැකි වන්නේත්, "මව්ස්" එක නම් වූ අදාල අංගය නිසි පරිදි ක්‍රියාත්මක කළ හොත් පමණෙකි. "මොනිටරය" නම් වූ තිරය සුන්දරව මවා පානා දේට ම වශීකෘතව, එක තැන පල්වෙන ඊතලය දක්වන ඉසව්වටම නෙත් සිත් යොමු කරවා ගත්තවුන් නොදැනුවත්වම ඔබනුයේ වාණිජකරණයේ බොත්තම්

**"මේ "මවුස්" එක වැඩ කරන්නෙම නෑනේ" පින්සල "කොම්පියුටරයේ" මොනිටර් එක දිහා බලාගෙනම වේගයෙන් "මවුස්" එක එහා මෙහා කරන ගමන් කිව්වා. ඒත් "කර්සර්" එක එකම තැන ! "කෝ බලන්න.. ඔය "මවුස්" එක ළඟදිනෙ ගත්තෙ" පන් ලියන මේසයෙන් නැගිටලා ආවා පින්ගෙ "කොම්පියුටරය" ගාවට. "සන්තානං මෑණියනේ....!" පන්ට වෙසක් අමතක වෙලා නත්තල් සිහිවුණා.**

නොවේ ද?.

වෙසක් සමයට පමණක් ම සීමා නොවී කෙරෙනා පින්කම් ද බොහෝ ය. කිනම් වූ පරමාර්ථයන්ගෙන් කෙරෙන්නේ දැයි විමසීමට පෙර කාර්යයන්ගෙ සමාජයකට වන සෙත පිළිබඳවත්, ඒ වෙනුවෙන් කෙරෙන කැපවීම පිළිබඳවත් විමසනු වටීයි. අයහපත් පරමාර්ථයන්ගෙන් කෙරෙන කාර්යයන්ගේ පළ ඒ ඒ අයටම නොවේ ද? සුනන්දා තිලකරත්න ආචාර්යවරිය මූලිකව ප්‍රකාශයට පත්කෙරෙන "හිරු කිරණ" බෞද්ධ පුවත් පතත්, ගාමිණි ෆොන්සේකා මාධ්‍යවේදියා මූලිකව ගුවන් ගතවන "සඳහම් හඬ" ගුවන්විදුලි වැඩසටහනත් මෙහිලා නිදසුන් සේ දක්වනු වටීයි. කුසල් කර බවුන් වඩා මාර්ග ඵලයන් ලබාගැනීමට මෛත්‍රී බුදුන් දවස වන තුරුම පෙරුම් පිරීමට අනවශ්‍ය බවත්, ධර්‍මය පවතින කාලයන්හි දී නොපමාව කුසල් කළ හොත්, දහමෙහි පිහිටියහොත් මෛත්‍රී බුදුන් පහළවීමට කලින් වුවද ඵලයන් ලබා ගතහැකි බවත් පහදා දෙමින් පළවන "හිරු කිරණ", ක්‍රිස්තු වර්ෂ 2012 දී එළැඹිය හැකි ව්‍යසන පිළිබඳව අවධාරණය කරන්නීය. "සඳහම් හඬ" ලොව ප්‍රථම සිංහල බෞද්ධ ගුවන් විදුලි වැඩසටහන ලෙසින් හැඳින්වේ. ලබන අගෝස්තුවේදී දෙවසර සපුරන "සදැහම් හඬ" නොයෙක් හරවත් අංග පෙළ ගන්වමින් සෑම බ්‍රහස්පතින්දාවකම පෙරවරු හයට විකාශය වේ. ජගත්, ශ්‍රීනා හා ගජමන් සහෘදයන් "තිසර එෆ්.එම්" හරහා විසුරුවන බෞද්ධ අංගය ද සිහිපත් කළ යුතුයි.



සිසිර දිසානායක

බෞද්ධාගමික කටයුතුවලට අමතරව වෙසක් මාසය තුල අසන්නට වූ ආරන්චි අතර සතුටු දායක ප්‍රවෘත්ති වූයේ "චැනල් 31" රූපවාහිනී නාලිකාවෙන් විකාශය කෙරෙන වැඩසටහන් අතුරින් පසුගිය වසරේ හොඳම වැඩසටහන ලෙස නිමල් අල්විස් අධ්‍යක්ෂකවරයා ඉදිරිපත් කරන "ශ්‍රී ලංකා මෝර්නිං ෂෝ" වැඩසටන "ඇන්ටෙනා එවොඩ්ස්" සම්මානය ලැබීමයි. ඊට අපගේ සුපැතුම්! ප්‍රවීණ සංගීතවේදී රෝහණ වීරසිංහයන්ගේ වැඩිමල් සොහොයුරු මර්වින් වීරසිංහ මහත්මා අප අතරේ ජීවත්ව හිඳ වියෝවීම කණගාටුදායක ප්‍රවෘත්තියක් විය. ඊට අපගේ කණගාටුව!

කලක් තිස්සේ සිට මෙල්බර්න් ප්‍රසංග වේදිකාවේ ගී ගැයූ පුෂ්පා තිසේරා ශිල්පිනියගේ "ඒ වසන්තයමයි" ගීත එකතුව දොරට වැඩීමේ ප්‍රසංගය ගීත රසිකයිනට අගනා අවස්ථාවක් වීය. මනා සංයමයකින් යුක්තව තිර, තීව්‍ර, මිහිරි හඬකින් ගී ගයන පුෂ්පා පැරණි ගී ගැයීමේ දී බොහෝ සෙයින් මුල් ගීයට ළංව ගැයීමට හපන්කම් දක්වන්නීය. ප්‍රසංගයේ ද තමන්ගේ ගී සොළොසට අමතරව පැරණි ගී කීපයක් ද ගයමින් ඒ හපන්කම පෑවාය අෑ. මෙල්බර්න් නුවරින් ගීත රචනයට මුල් වරට බ්‍රයන් ජේගනාදන්, සුජාතා අබේසිංහ සමඟින් පුෂ්පා තිසේරාද පිවිසෙන්නීය මේ ගී සමුච්ඡය තුලින්. ඔවුන්ගේ නිර්මාණ විඳීමට ලැබීම සතුටට කාරණයක් නොවේ ද?

අවසන් වශයෙන් සටහන් තැබෙනුයේ මව්වරුන්ගේ දිනය පිළිබඳවයි. පසුගිය වර ලිපිය අවසන් කළා සේ ම ජීවිත සටහන නිබඳව මුහුණ දෙන අසහාය සෙබලියක නොවේද අම්මා ? ජිවිත කාලය පුරාවටම තම දරු දැරියන් මතු නොව බොහෝ විට මුණුපුරු මිණිපිරියන් ද වෙනුවෙන් සටන්වදිනා ඇයගේ සේවා කාලය දිනකට ලඝු කොට තැකීම විහිළුවකි. ගණක යන්ත්‍රයත්, "මවුස්" අංගයත් පටලවාගත් යුගයකි මේ ! ගිය සැරේ අමුනන්න බැරි වුණ පින් ඇඳපු "සෙබලිය" පන් ලියවිල්ල අගට ඇමිණුවා.